# කාර්ය සාධන වාර්තාව

# செயலாற்றுகை அறிக்கை

# PERFORMANCE REPORT



# 2015

## භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව

## திறைசேரி செயற்பாடுகள் திணைக்களம்

## Department of Treasury Operations


| | | |
|---|---|---|
| මුදල් අමාත්‍යාංශය | நிதி அமைச்சு | Ministry of Finance |
| කොළඹ 01. | கொழும்பு 01. | Colombo 01. |

# පටුන

පිටු අංකය

- ➢ දැක්ම 02
- ➢ මෙහෙවර 02

1. හැඳින්වීම 03
2. ප්‍රධාන කාර්යයන් 03
3. සංවිධාන ව්‍යුහය 04
4. සේවක සංඛ්‍යා තොරතුරු 05
5. මානව සම්පත් සංවර්ධනය 06
6. මූල්‍ය කාර්ය සාධනය 10
7. භෞතික කාර්ය සාධනය 12

7.1 මුදල් කළමනාකරණය 12

7.2 රාජ්‍ය ණය කළමනාකරණය 16

7.3 විදේශාධාර කළමනාකරණය 22

7.4 රාජ්‍ය ආදායම් 23

7.5 භාණ්ඩාගාර කේවල ගිණුම් පද්ධතිය හා භාණ්ඩාගාර මූල්‍ය කළමනාකරණ පද්ධතිය 26

7.6 දේපල ණය ඇපකර අරමුදල 29

## ➢ දැක්ම

රාජ්‍ය අරමුදල් කළමනාකරණයේ දකුණු  ආසියානු කලාපයේ විශිෂ්ඨතමයා බවට පත්වීම.

## ➢ මෙහෙවර


අරමුදල් ගිණුම්කරණය හා රාජ්‍ය ණය ගිණුම්කරණය පිළිබඳ භාරකාරත්වය දරමින්, රාජ්‍ය වැය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ඒකාබද්ධ අරමුදල හා වෙනත් භාණ්ඩාගාර අරමුදල් කාර්යක්ෂමව හා අරපිරිමැස්මෙන් උපයෝගී කර ගැනීමද, ආදායම් එකතු කිරීම් හා රාජ්‍ය ණය ගැනීම් සම්බන්ධව සම්බන්ධීකාරකයෙකු ලෙස ක්‍රියා කිරීම සඳහා ද කැපවීම.

# 1. හැඳින්වීම

භාණ්ඩාගාරය තුළ ඒකාබද්ධ අරමුදල යටතේ ක්‍රියාත්මක රාජ්‍ය මුදල් ප්‍රවාහය හා රාජ්‍ය ණය සම්බන්ධයෙන් අදාල කටයුතු කාර්යක්ෂමව කළමනාකරණය කිරීමේ අභිලාෂයෙන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව 2004 ජූලි 28 දින ආරම්භ කරන ලදි. මෙම අභිලාෂයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ජාතික අයවැය ලේඛණයේ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් තත්‍ය මුදල් ගලා ඒම් හා මුදල් ගලායාම් බවට පරිවර්තනය කරගෙන ඒවා කාර්යක්ෂමව හා ඵලදායිව කළමනාකරණය කිරීමට අවශ්‍ය සැලසුම් වාර්ෂිකව, මාසිකව හා දෛනික පදනමින් සකස් කර, ජාතික අයවැය ලේඛණය මගින් පරිකල්පිත රජයේ ප්‍රතිපත්ති සාධනය කර ගැනීමට නිරන්තරයෙන් කටයුතු කරමින් පවති.

2. ප්‍රධාන කාර්යයන්:
   - භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ කළමනාකරණය.
   - දේශීය හා විදේශීය වාණිජ ණය ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම.
   - ගෙවීම් පද්ධතිය හරහා භාණ්ඩාගාරයේ අරමුදල් මුදා හැරීම.
   - වියදම් ආයතනවල අරමුදල් අවශ්‍යතා තක්සේරු කර ප්‍රමුඛතා මත අරමුදල් නිදහස් කිරීම.
   - භාණ්ඩාගාර ඇපකර නිකුත් කිරීම.
   - රජයේ ණය දීම මගින් ක්‍රියාත්මක වැඩසටහන්වලට අදාලව මූල්‍ය ප්‍රවාහ මෙහෙයවීම.
   - බදු නොවන ආදායම් ශීර්ෂ 10 ක් යටතේ ආදායම් ඇස්තමේන්තු කිරීම, එකතු කිරීම හා ගිණුම්ගත කිරීම.
   - විදේශාධාර ණය හා ප්‍රදාන යටතේ ලැබෙන මුදල් වැය යෝජනා සඳහා පහසුකම් සැලසීම.
   - රජයේ ණය ගැනීම් හා ආපසු ගෙවීම් ගිණුම්ගත කිරීම.
   - රජයේ බැංකු ගිණුම් හා අග්‍රිම ගිණුම් ආරම්භ කිරීම සඳහා බලය දීම හා අධීක්ෂණය.
   - විදේශ ව්‍යාපෘති ගිණුම් තැබීම පිළිබඳව උපදෙස් ලබා දීම, අධීක්ෂණය හා පහසුකම් සැලසීම.

## 3. සංවිධාන ව්‍යුහය


අධ්‍යක්ෂ ජනරාල්
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ, ආදායම් සහ ප්‍රතිසංස්කරණ)
අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (විදේශාධාර, රාජ්‍ය ණය, පාලන හා ගිණුම්)
අධ්‍යක්ෂ (ආදායම්)
අධ්‍යක්ෂ (අය වැය ක්‍රියාත්මක කිරීම – A)
අධ්‍යක්ෂ (අය වැය ක්‍රියාත්මක කිරීම – B)
අධ්‍යක්ෂ (ඒකාබද්ධ අරමුදල් කළමනාකරණ)
අධ්‍යක්ෂ (මුදල් කළමනාකරණ)
අධ්‍යක්ෂ (විදේශාධාර කළමනාකරණ)
අධ්‍යක්ෂ (ණය කළමනාකරණ)
නි.අ/ස.අ (ආදායම් එකතු කිරීම හා ගිණුම්)
නි.අ/ස.අ (BE / 1)
නි.අ/ස.අ (BE / 2)
නි.අ/ස.අ (BE / 3)
නි.අ/ස.අ (BE / 4)
නි.අ/ස.අ (මුදල් කළමනාකරණ)
නි.අ/ස.අ (විදේශාධාර කළමනාකරණ)
නි.අ/ස.අ (ණය හා ප්‍රධාන කළමනාකරණ )
ස.අ. (පාලන)
ස.අ. (සැපයුම් හා ගිණුම්)
පරි.නි.

## 4. සේවක සංඛ්‍යා තොරතුරු

4. (අ) 2015.12.31 දිනට සේවක සංඛ්‍යා තොරතුරු

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සිටින කාර්ය මණ්ඩලය |
|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | 02 | 02* |
| ශ්‍රී.ලං.ග.සේ. I පන්තිය | 07 | 08 |
| ශ්‍රී.ලං.ග.සේ. II / III පන්තිය | 09 | 08 |
| ශ්‍රී.ලං.ප.සේ. III | 01 | 01 |
| පරිපාලන නිලධාරී | 01 | 01 |
| සංවර්ධන නිලධාරී | 20 | 15 |
| රා.ක.ස. I /II/ III පන්තිය | 55 | 53 |
| තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සහකාර | 7 | 1 |
| රියදුරු | 7 | 7 |
| කා.කා.සේ. I /II/ III පන්තිය | 12 | 12 |
| එකතුව | 122 | 109 |

* ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ විශේෂ ශ්‍රේණියේ තනතුරක් වන අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරක වැඩ බැලීම සඳහා I ශ්‍රේණියේ එක් ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කර ඇත.

## 5. මානව සම්පත් සංවර්ධනය

කාර්ය මණ්ඩලයේ නිළධාරීන්ගේ දැනුම කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම සඳහා පවත්වනු ලබන පුහුණු පාඨමාලා යටතේ දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන පාඨමාලා සඳහා නිළධාරීන් සහභාගී කරවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලදී.

### 5. (අ) දේශීය පුහුණු පාඨමාලා - 2015

| නිළධාරී ගණය | පුහුණු පාඨමාලා ගණන | පුහුණු වූ නිළධාරීන් ගණන | පුහුණුව ලැබූ ක්ෂේත්‍රය | ආයතනය/ ස්ථානය |
|---|---|---|---|---|
| මාණ්ඩලික නිළධාරීන් | 04 | 03 | ඊ- රාජ්‍ය සහ වෙනස්වීම් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | මිලෝදා ආයතනය |
| | | 05 | රාජ්‍ය අංශයේ ගිණුම් ප්‍රමිති | අර්නස්ට් සහ යංග් ආයතනය |
| | | 01 | කැබිනට් පත්‍රිකා ලිවීම | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| | | 01 | ප්‍රසම්පාදනය පිළිබඳ සාරාංශගත පුහුණුව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | 02 | 04 | රැකියා ප්‍රවර්ධනය සඳහා ඉංග්‍රීසි | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| | | 01 | ආකල්ප සහ සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩමුළුව | මානව සම්පත් අභිවර්ධන ආයතනය |
| සංවර්ධන නිළධාරී | 02 | 05 | රැකියා ප්‍රවර්ධනය සඳහා ඉංග්‍රීසි | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය |
| | | 09 | ඊ- රාජ්‍ය සහ වෙනස්වීම් කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන | මිලෝදා ආයතනය |
| සියල්ලන්ටම | 01 | 15 | රාජ්‍ය නිළධාරීන් සඳහා දෙමළ භාෂාව පිළිබඳ පුහුණු පාඨමාලාව | දෙපාර්තමේන්තු පරිශ්‍රයේදී |

මීට අමතරව දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්යමණ්ඩලයේ කණ්ඩායම් හැඟීම සහ ආකල්ප සංවර්ධනය කිරීම පෙරදැරි කරගෙන 2015.10.24 හා 25 යන දෙදින කලාවැව ජාතික ජලජීවී හා වගා සංවර්ධන අධිකාරියේ පුහුණු ආයතනයේ දෙදින පුහුණු පාඨමාලාවක් පවත්වන ලදි. මෙහිදි පුද්ගල කාර්යාභිවර්ධනය හා පුද්ගල සංවර්ධනය පිළිබඳ පුහුණුවක් මෙහිදි ලබා දෙන ලදි. එය කාර්ය මණ්ඩල නිලධාරීන්ගේ ස්වයං සංවර්ධනයට මෙන්ම එකිනෙකා අතර අන්‍යෝන්‍ය සම්බන්ධතා ඇති කිරීමට සහාය විය. මේ සඳහා දෙපාර්තමේන්තුවේ නිළධාරීන් 47 දෙනෙකු සහභාගී විය.

මීට අමතරව මාණ්ඩලික නිළධාරීන්හට විදේශ පුහුණු පාඨමාලා සහ සමුළු සඳහා සහභාගී වීමේ අවස්ථා 25ක් හිමිවිය.

**5. (ආ) විදේශීය පුහුණු පාඨමාලා සහ සමුළු සඳහා සහභාගීත්වය - 2015**

| | පුහුණුව / සම්මන්ත්‍රණය හෝ සමුළුව | රට | කාල සීමාව | සහභාගී වූ නිළධාරීන් ගණන |
|---|---|---|---|---|
| 01 | රාජ්‍ය අංශයේ ප්‍රගතිය සඳහා නායකත්ව උපායමාර්ග පිළිබඳ සමුළුව | ඇමෙරිකා එක්සත් ජනපදය | 20.09.2015 - 25.09.2015 | 01 |
| 02 | නායකත්වය, සන්නිවේදනය හා පුද්ගලාන්තර කුසලතා සංවර්ධනය තුළින් ස්වයං සංවර්ධනය ලබා ගැනීම | මැලේසියාව | 29.08.2015 - 07.09.2015 | 06 |
| 03 | ඔක්ස්ෆර්ඩ් උසස් මූල්‍ය පාඨමාලාව | මැලේසියාව | 12.09.2015 - 22.09.2015 | 07 |
| 04 | රාජ්‍ය අංශයේ ගිණුම්කරණය | මැලේසියාව | 24.08.2015 - 25.08.2015 | 01 |
| 05 | ADBI ණය ශ්‍රේණිගත සංසදය | ජපානය | 10.07.2015 | 01 |

|  | පුහුණුව / සම්මන්ත්‍රණය හෝ සමුළුව | රට | කාල සීමාව | සහභාගී වූ නිළධාරීන් ගණන |
|---|---|---|---|---|
| 06 | සංවර්ධන මූල්‍ය සඳහා මුදල් බැර කිරීම ප්‍රචලිත කිරීම සඳහා වූ ADB සංසදය | පිලිපීනය | 18.03.2015 - 19.03.2015 | 01 |
| 07 | සංවර්ධනය වෙමින් පවතින රටවල භාණ්ඩාගාර කළමනාකරණය නවීකරණය කිරීමේ සමුළුව | සිංගප්පූරුව | 27.07.2015 - 31.07.2015 | 02 |
| 08 | යුරෝපීය සහ ආසියා කලාපීය රටවල් සඳහා වූ චීනයේ ආර්ථික හා සමාජ සංවර්ධන අත්දැකීම් පිළිබඳ සමුළුව | චීනය | 01.07.2015 - 21.07.2015 | 01 |
| 09 | ණය කළමනාකරණය පිළිබඳ කාර්ය සාධනය ඇගයීම | වියට්නාමය | 14.12.2015 - 18.12.2015 | 01 |
| 10 | ණය කළමනාකරණ පහසුකරණය තුළින් ස්වයං සංවර්ධනය ලබා ගැනීම සඳහා වූ ලෝක බැංකුවේ වාර්ෂික සංසදය | පිලිපීනය | 03.06.2015 - 04.06.2015 | 01 |
| 11 | DIPPCA ඩිප්ලෝමාව සඳහා වූ වෙනත් රටක ප්‍රසම්පාදන අත්දැකීම් පිළිබඳ පුහුණුව | මැලේසියාව | 21.01.2015 - 27.01.2015 | 01 |
| 12 | රාජ්‍ය මූල්‍ය පිළිබඳව පශ්චාත් උපාධිය | දකුණු කොරියාව | 23.08.2015 - 28.02.2017 | 01 |
| 13 | සංවර්ධනය වෙමින් පවතින රටවල අභ්‍යන්තර ප්‍රදේශ සංවර්ධනය සඳහා විදේශ ප්‍රාග්ධනීකරණය පිළිබඳ හැඳින්වීම හා උපයෝගීතාවය පිළිබඳ වැඩමුළුව | චීනය | 21.10.2015 – 10.11.2015 | 01 |

## 5. (ඇ) චක්‍රලේඛ හා විධිවිධාන

රාජ්‍ය අරමුදල් කළමනාකරණය වැඩිදියුණු කිරීම සඳහා 2015 වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් පරිදි චක්‍රලේඛ නිකුත් කරමින් උපදෙස් හා මග පෙන්වීම් ලබා දී ඇත.

| දිනය | චක්‍රලේඛ අංකය | විෂයය |
|---|---|---|
| 2015.05.21 | TOD-2015-01 | 2016 වර්ෂය සඳහා ආදායම් ඇස්තමේන්තු |
| 2015.05.21 | TOD-2015-02 | 2015.06.30 දිනට හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම. |
| 2015.07.08 | TOD-2015-04 | 2015 ජුලි 18 දිනට යෙදෙන රාමසාන් උත්සවය වෙනුවෙන් ඉස්ලාම් බැතිමතුන්ට 2015 ජුලි මස වැටුප කලින් ගෙවීම. |
| 2015.10.15 | TOD-2015-05 | 2016 වර්ෂය තුළදී වැටුප්,වැටුප් අත්තිකාරම් සහ විශ්‍රාම වැටුප් ගෙවීම. |
| 2015.10.23 | TOD-2015-03 | නිල බැංකු ගිණුම් විවෘත කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය |
| 2015.11.23 | TOD-2015-06 | 2015 වසර සඳහා මුදල් පොත පියවීම සහ අග්‍රිම ගිණුම පියවීම. |
| 2015.12.07 | TOD-2015-07 | 2015.12.31 දිනට හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කිරීම. |
| 2015.12.14 | TOD-2015-08 | 2016 වර්ෂය සඳහා වන විසර්ජන පනත යටතේ සලසා ඇති මූල්‍ය ප්‍රතිපාදන අනුව කෙරෙන ගෙවීම් වෙනුවෙන් එක් එක් දෙපාර්තමේන්තු වෙත වාර්ෂික අග්‍රිම සීමාවන් නියම කිරීම සඳහා තොරතුරු කැඳවීම. |

# මූල්‍ය කාර්යසාධනය - 2015

| වැය විෂය | කාණ්ඩය/ වැය විෂය/ අයිතමය/ විස්තරය | 2014 | | 2015 | | 2014 තත්‍ය වියදමට අනුව | |
|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුව | තත්‍ය | ඇස්තමේන්තුව | තත්‍ය | 2015 වියදමේ වැඩිවීම/(අඩුවීම) | එහි ප්‍රතිශතය (%) |
| | පුනරාවර්තන වියදම් | 3,971,643 | 3,891,932 | 976,675 | 810,593 | (3,081,339) | (79.17) |
| | **පුද්ගල පඩිනඩි** | **40,410** | **40,102** | **55,980** | **53,954** | **13,852** | **34.54** |
| 1001 | වැටුප් හා වේතන | 24,500 | 24,214 | 26,000 | 24,583 | 369 | 1.52 |
| 1002 | අතිකාල සහ නිවාඩු දින වැටුප් | 510 | 508 | 600 | 428 | (80) | (15.75) |
| 1003 | වෙනත් දීමනා | 15,400 | 15,380 | 29,380 | 28,943 | 13,563 | 88.19 |
| | **ගමන් වියදම්** | **1,370** | **1,365** | **940** | **876** | **(489)** | **(35.82)** |
| 1101 | දේශීය | 70 | 69 | 100 | 71 | 2 | 2.90 |
| 1102 | විදේශීය | 1,300 | 1,296 | 840 | 805 | (491) | (37.89) |
| | **සැපයීම්** | **3,203** | **3,198** | **3,805** | **3,775** | **577** | **18.04** |
| 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 1,010 | 1,010 | 1,700 | 1,678 | 668 | 66.14 |
| 1202 | ඉන්ධන | 2,125 | 2,120 | 2,030 | 2,025 | (95) | (4.48) |
| 1203 | ආහාරපාන හා නිල ඇඳුම් | 68 | 68 | 75 | 72 | 4 | 5.88 |
| | **නඩත්තු වියදම්** | **1,278** | **1,267** | **2,175** | **1,621** | **354** | **27.94** |
| 1301 | වාහන | 1,000 | 992 | 1,410 | 937 | (55) | (5.54) |
| 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 210 | 210 | 465 | 451 | 241 | 114.76 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 68 | 65 | 300 | 233 | 168 | 258.46 |
| | **සේවා** | **2,344** | **2,337** | **3,275** | **3,249** | **912** | **39.02** |
| 1401 | ප්‍රවාහන | 860 | 854 | 1,375 | 1,374 | 520 | 60.89 |
| 1402 | තැපැල් හා සන්නිවේදන | 1,410 | 1,410 | 1,775 | 1,756 | 346 | 24.54 |
| 1405 | වෙනත් | 74 | 73 | 125 | 119 | 46 | 63.01 |
| | **මාරු කිරීම්** | **3,923,038** | **3,843,663** | **910,500** | **747,118** | **(3,096,545)** | **(80.56)** |
| 1503-01 | ලොතරැයි ආදායම් ආපසු ගෙවීම් | 499,363 | 420,012 | 509,450 | 346,105 | (73,907) | (17.60) |
| 1504 | ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට භූමිතෙල් සහනාධාර ලබා දීම | 3,022,775 | 3,022,775 | - | - | (3,022,775) | (100.00) |
| 1505-01 | රාජ්‍ය සේවක රක්ෂණ යෝජනා ක්‍රමය සඳහා රජයේ දායකත්වය | 400,000 | 400,000 | 400,000 | 400,000 | - | - |
| 1506 | රජයේ සේවකයින් සඳහා දේපල ණය පොළී | 900 | 876 | 1,050 | 1,013 | 137 | 15.64 |

රු.'000

| වැය විෂය | කාණ්ඩය/ වැය විෂය/අයිතමය/ විස්තරය | 2014 | | 2015 | | 2014 තත්‍ය වියදමට අනුව | |
|---|---|---|---|---|---|---|---|
| | | ඇස්තමේන්තුව | තත්‍ය | ඇස්තමේන්තුව | තත්‍ය | 2015 වියදමේ වැඩිවීම/(අඩුවීම) | එහි ප්‍රතිශතය (%) |
| | **මූලධන වියදම්** | **6,892** | **6,460** | **6,300** | **5,350** | **(1,110)** | **(17.18)** |
| | **මූලධන වත්කම් වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | **3,242** | **2,955** | **1,700** | **1,609** | **(1,346)** | **(45.55)** |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,300 | 1,217 | 100 | 83 | (1,134) | (93.18) |
| 2002-1 | භාණ්ඩාගාර කේවල ගිණුම් ක්‍රමය ක්‍රියාත්මක කිරීම | 1,000 | 812 | 1,000 | 981 | 169 | 20.81 |
| 2002-2 | වෙනත් | 142 | 140 | 100 | 51 | (89) | (63.57) |
| 2003 | වාහන | 800 | 786 | 500 | 494 | (292) | (37.15) |
| | **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | **3,000** | **2,999** | **2,800** | **1,950** | **(1,049)** | **(34.98)** |
| 2102 | ගෘහභාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 3,000 | 2,999 | 2,800 | 1,950 | (1,049) | (34.98) |
| | **මානව සම්පත් සංවර්ධනය** | **650** | **506** | **1,800** | **1,791** | **1,285** | **253.95** |
| 2401 | දැනුම වර්ධනය හා ආයතනික සංවර්ධනය | 650 | 506 | 1,800 | 1,791 | 1,285 | 253.95 |

## 7. භෞතික කාර්යසාධනය

### 7.1 මුදල් කළමනාකරණය

#### 7.1.1 භාණ්ඩාගාර මුදල් ප්‍රවාහ කළමනාකරණය

රාජ්‍ය මූල්‍ය නිසි ලෙස කළමනාකරණය කිරීම, අයවැය ප්‍රතිපත්ති ඉලක්ක සපුරාලීම සහ ණය ගැනීමේ පිරිවැය අවම කිරීම යන අරමුණු තහවුරු කර ගැනීම සඳහා 2015 වර්ෂය තුලදීද භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ඵලදායී මූල්‍ය සැලසුම්කරණ සහ කළමනාකරණ ක්‍රමෝපායන් ක්‍රියාත්මක කරන ලදී. මෙහිදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ මූලික වගකීම වන්නේ ප්‍රමුඛතාවය පදනම් කරගෙන නිසි වේලාවට රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා අනෙකුත් ආයතන වෙත මුදල් නිදහස් කිරීමයි. අයවැය මගින් අපේක්ෂිත ආදායම් නිසි පරිදි හා කාලීනව නොලැබීම හේතුවෙන් අරමුදල් ලැබීම් ප්‍රවාහයන් ප්‍රමානවත් නොවීම නිසා ප්‍රායෝගිකව දුෂ්කරතා මතුවේ. එම නිසා එක් එක් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වල අවශ්‍යතාවන් වඩාත් නිවැරදිව තක්සේරු කර වාර්ෂික අයවැය වඩා කාර්යක්ෂමව හා ඵලදායීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වූ මුදල් නිදහස් කිරීම මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය අතරින් එක් සුවිශේෂී වගකීමක් විය.

භාණ්ඩාගාර අරමුදල් නිසි පරිදි කළමණාකරනය කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් මාසික ක්‍රියාකාරී මුදල් සැලැස්මක්, පුරෝකථනය කරන ලද සමස්ථ මුදල් ගලා ඒම, මුදල් ප්‍රවාහ ගලා යාමේ සීමාවන් හා ණය ගැනීම් වල කාලයන් මත පදනම්ව පිළියෙල කරන ලදී. පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද විසර්ජන පනතට අනුකූලව පුරෝකථනය කරන ලද මුදල් ගලා ඒම් සහ ගලා යාම් හා සැලසුම්කරන ලද ණය ගැනීම්ද ඇතුලත් වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව එක් එක් මාසය සඳහා මාසික මුදල් ප්‍රවාහයන් ද වර්ෂය තුල පිළියෙල කරන ලදී.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව හා සුරා බදු දෙපාර්තමේන්තුව විසින් සපයන ලද ඇස්තමේන්තු ගත ආදායම් විස්තර හා පසුගිය මාසවල හැසිරීම් රටාවන් අනුව පිළියෙල කරන ලද බදු සහ බදු නොවන ආදායම් සහ එක් එක් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු වලින් වාර්ෂිකව හා මාසිකව ලබා ගන්නා ලද අක්මුදල් අවශ්‍යතාවන් සැලකිල්ලට ගැනීමෙන් මෙම වාර්ෂික හා මාසික මුදල් ප්‍රවාහ ප්‍රකාශයන් පිළියෙළ කරන ලදී. ක්‍රියාකාරී මාසික මුදල් ප්‍රවාහය දිනපතා යාවත්කාලීන කිරීම තුලින්, වියදම් ක්‍රමවත්ව පාලනය

කිරීම හා ආදායම් වර්ධනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති තීරණ ගැනීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මනා දායකත්වයක් ලබා දී ඇත.

ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේදී නිරන්තර අධීක්ෂණයකට ලක්කිරීම තුලින් අවශ්‍ය අවස්ථාවන්හිදී එම ප්‍රතිපත්තීන් හි කාලීන වෙනස්කම් සිදු කිරීමට ඉඩ ප්‍රස්ථා සැලසේ. මෙය අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කර ගැනීමටද මනා පිටුවහලකි. වාර්ෂික අයවැය ප්‍රතිපත්ති ඉලක්ක සපුරා ගැනීමේදී ක්‍රියාත්මක කරනු ලබන මුදල් කළමනාකරණ ක්‍රියාවලියේදී අවශ්‍ය කාලීන උපදෙස් හා තීරණ ගැනීම සඳහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් 2015 වර්ෂය තුලදී ද මුදල් ප්‍රවාහ රැස්වීම් 16 ක් පවත්වන ලදී. ප්‍රධාන ආදායම් උපයන දෙපාර්තමේන්තු වන දේශිය ආදායම්, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු, මෝටර් රථ ප්‍රවාහන යන දෙපාර්තමේන්තු වල ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පවත්වන ලදී. ඒ සඳහා අවශ්‍ය විශ්ලේශණය කිරීමේ හා තාක්ෂණික සහාය ලබාදීමේ අරමුණින් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරු ඇතුළු භාණ්ඩාගාරයේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ අදාල සෙසු මාණ්ඩලික නිලධාරීන් ද මේ සඳහා සහභාගී වන ලදී.

මෙම රැස්වීම් වලදී, ආදායම් එකතු කිරීම හා වියදම් සඳහා ඇති අරමුදල් ඉල්ලුම සම්බන්ධයෙන් වූ නිරන්තර සුපරික්ෂණය හා ඇගයීම, අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කර ගැනීම සඳහා අවශ්‍ය වූ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමට වූ ක්‍රමෝපායන්හි අවශ්‍ය වෙනස්කම් සිදුකර ගැනීමට ඉවහල් විය.

වෙනත් වසර වලදී මෙන්ම 2015 වසරේදී ද අයවැය ලේඛනයේ ලැබීම් හා ගෙවීම් අතර පරතරය පියවා ගැනීම දේශීය හා විදේශීය රාජ්‍ය ණය ගැනීම් මගින් සිදු කෙරිනි.


### 7.1.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව භාණ්ඩාගාර මුදල් ලැබීම්

**වගුව 7.1 (අ) ආදායම් එකතු කිරීම් - 2015**

(රු. මිලියන)

| | ඇස්තමේන්තුව | තත්‍ය | ප්‍රතිශතය % |
|---|---|---|---|
| බදු ආදායම් | 1,277,700 | 1,270,065 | 99 |
| බදු නොවන ආදායම් | 76,239 | 63,046 | 83 |
| ප්‍රදාන | 3,166 | 1,540 | 49 |
| **මුළු එකතුව** | 1,357,105 | 1,334,651 | 98 |


**රූපසටහන 7.1 (අ) ඇස්තමේන්තුගත සහ තත්‍ය ආදායම් 2015**




**වගුව 7.1(ආ) ආදායම් එකතු කිරීම් - 2011 සිට 2015 දක්වා** ***(රු. මිලියන)***

| | 2011 | 2012 | 2013 | 2014 | 2015 |
|---|---|---|---|---|---|
| බදු ආදායම | 795,696 | 833,520 | 920,225 | 987,712 | 1,270,065 |
| බදු නොවන ආදායම | 86,586 | 124,359 | 102,447 | 97,237 | 63,046 |
| ප්‍රදාන | 3,267 | 3,171 | 2,307 | 2,495 | 1,540 |

**රූපසටහන 7.1(ආ) රාජ්‍ය ආදායමේ ස්වරූපය 2011-2015**



ඉහත 7.1 (අ) වගුවෙන් පෙන්නුම් කරන ආකාරයට, 2015 වර්ෂය තුළ ඇස්තමේන්තු ගත මුළු ආදායමෙන් 98% ක ප්‍රමාණයක ආදායමක් එකතු කර ගෙන ඇත. මෙය ඇස්තමේන්තු ගත බදු මුළු ආදායමින් 99% ක ප්‍රතිශතයකින්ද ඇස්තමේන්තුගත බදු නොවන ආදායම් වලින් 83% ක ප්‍රතිශතයකින්ද ඇස්තමේන්තු ගත ප්‍රදාන වලින් 49% ප්‍රතිශතයකින්ද සමන්විත වේ.

ආදායම් ලැබීම් සුපරීක්ෂණය තවදුරටත් ශක්තිමත් කිරීම හේතුවෙන් 2015 වසරේ භාණ්ඩාගාර මුළු බදු මුදල් ලැබීම් රු. මිලියන 1,270,065ක් වු අතර එය 2014 වසරේ එකතු කරන ලද ආදායම වන රු. මිලියන 987,712 හා සැසදීමේදී 29% ක වැඩිවීමකි. 2015 වසරේදී හඳුන්වාදුන් සුපිරි ලාභ බද්ද, කැසිනෝ බද්ද හා මෝටර් රථ ආනයනය මත නිෂ්පාදන බදු සංශෝධනයන් බදු ආදායම වැඩි වීමට ප්‍රධාන හේතුවක් විය. බහු පාර්ශවික මුලාශ්‍ර වලින් ලැබු ප්‍රදාන 2014 ට සාපේක්ෂව 38% කින් අඩු වීම හේතුවෙන් විදේශ ප්‍රදානයන් රුපියල් මිලියන 1,540 ක් දක්වා අඩු විය. මේ අනුව 2015 වසරේ මුළු ආදායමින් 95% ක් බදු ආදායමින්ද, ඉතිරි 5% ක් බදු නොවන ආදායමෙන් හා ප්‍රදාන මගින් ලැබී ඇත.

### 7.1.3 භාණ්ඩාගාර මුදල් නිදහස් කිරීම

ප්‍රාග්ධන වියදම් සඳහා වන ආයෝජනයන් අපේක්ෂිත ආර්ථික වෘද්ධියට සරිලන පරිදි අවශ්‍ය මට්ටමේ පවත්වාගෙන යාම සඳහා වන රජයේ ප්‍රයත්නයට දායකත්වයක් සපයමින් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව 2015 වසරේදී සිය මුදල් ප්‍රවාහයේ අග්‍රිම නිදහස් කිරීම් කරන ලදී. මෙහිදි එක් අභියෝගයක් වුයේ ණය ගැනීම් වෙනුවෙන් ගෙවිය යුතු පොලිය ද ඇතුළුව රජයේ පුනරාවර්ථන වියදම් රාජ්‍ය ආදායම තුලින්ම කළමනාකරණය කර ගැනීමේ උත්සාහයයි.

අංක 1897/15 හා 2015.01.18 දිනැති ගැසට් පත්‍රය හා එහි සංශෝධනය අනුව මෙන්ම අංක 1933/13 හා 2015.09.21 දිනැති ගැසට් පත්‍රය සහ ඉන්පසු සිදු කරන ලද සංශෝධන අනුව 2015 වර්ෂය තුලදී අමාත්‍යාංශ විෂයපථයන් වරින් වර අවස්ථා කිහිපයකදී වෙනස් වීම් වලට භාජනය විය. එසේ සිදුකරන ලද සංශෝධන හේතු කොටගෙන, මෙම දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන ආංශීය වර්ගීකරණයන්ට අනුව අයවැය ක්‍රියාත්මක කිරීමට අදාල අරමුදල් නිදහස් කිරීමේ ප්‍රගතිය පෙන්වනු ලබන දත්ත හා තොරතුරු 2015 වර්ෂය තුලදී සංසන්දනාත්මකව පවත්වාගෙන යාම ප්‍රායෝගික නොවීය. ඒ බැවින් 2015 වර්ෂයේ අයවැය ක්‍රියාත්මක කිරීමේ සමස්ථ ප්‍රතිඵලය වගු අංක 7.1 (ඇ) අනුව සාරාංශ කර දැක්විය හැකිය.

වගුව :-7.1(ඇ) වියදම් වර්ග අනුව අක්මුදල් නිදහස් කිරීම (රු.මිලියන)

| | 2014 | 2015 |
|---|---|---|
| පුද්ගල පඩිනඩි සඳහා | 475,752 | 604,861 |
| විශ්‍රාම වැටුප් සඳහා | 121,603 | 151,957 |
| සමෘද්ධි / පොහොර සහනාධාර සඳහා | 46,797 | 90,106 |
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 235,910 | 243,324 |
| පොලී ගෙවීම් සඳහා | 449,826 | 530,869 |
| ණය ආපසු ගෙවීම් | 627,045 | 832,765 |
| ප්‍රාග්ධන වියදම් සඳහා | 377,569 | 390,588 |

පුද්ගල පඩිනඩි, විශ්‍රාම වැටුප් හා සමෘද්ධි සහනාධාර වැඩි වීම හේතුවෙන් 2014 වසරට සාපේක්‍ෂව පුනරාවර්ථන වියදම් සඳහා අක්මුදල් නිදහස් කිරීම් 22% කින් වැඩි වී ඇත. එයට අමතරව ණය සේවා සඳහා රු. මිලියන 1,363,634 ක් වැය වී ඇති අතර එය 2014 හා සාපේක්ෂව 26% ක වර්ධනයකි. ප්‍රාග්ධන වියදම් සඳහා අක්මුදල් නිදහස් කිරීම් 2014 ට සාපේක්ෂව 3% කින් වැඩි වී ඇත.

## 7.2. රාජ්‍ය ණය කළමනාකරණය

### 7.2.1 රාජ්‍ය ණය වැඩසටහන – 2015

පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්ෂික විසර්ජන කෙටුම්පතෙහි 2015 වර්ෂයේ අයවැය ලේඛණයට අදාලව අයවැය පරතරය මූල්‍යනය කිරීම සඳහා දළ ණය ගැනීමේ සීමාව රුපියල් බිලියන1780 ක් ලෙස නිශ්චය කර ඇත. මෙම සීමාව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව 2014 අංක 41 දරණ විසර්ජන පනත මඟින් අනුමත කර ඇත. පසුව, 2015 අයවැය ලේඛණය 2015 අංක 01 දරණ පනත මඟින් සංශෝධනය වුවත් රුපියල් බිලියන 1780 ක් වූ දළ ණය ගැනීමේ සීමාව වෙනස් නොවුනි.

සත්‍ය දළ ණය ගැනීම් රුපියල් බිලියන 1745 ක් වූ අතර එයින්, දේශීය මූලාශ්‍ර වලින් රුපියල් බිලියන 1,188 ක් හා විදේශීය මූලාශ්‍ර වලින් රුපියල් බිලියන 556 ක් දායක විය. විදේශීය මූලාශ්‍ර වලින් දළ ණය ලබා ගැනීම් වලින් විදේශීය වෙළඳපලෙහි ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම් මඟින් රුපියල් බිලියන 298 ක් හා ව්‍යාපෘති හා වැඩසටහන් ණය රුපියල් බිලියන 258 ක් ඇතුළත් වේ. 2015 වර්ෂයේ රුපියල් බිලියන 1,745 ක දළ ණය ගැනීම් 2014 වර්ෂයේ රුපියල් බිලියන 1,425 ට වඩා සියයට 23 ක වැඩිවීමකි.

2015 වර්ෂයේ රුපියල් බිලියන 1,188 ක සත්‍ය මුළු දේශීය ණය ගැනීම් 2014 හි රුපියල් බිලියන 1002 ට වඩා සියයට 19 ක වැඩිවීමකි. ප්‍රධාන වශයෙන් මෙම වැඩිවීම සිදුවූයේ 2015 වර්ෂයේදී භාණ්ඩාගාර බැඳුම්කර හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කිරීම නිසාය.


**වගුව 7.2. 1 ණය ගැනීම් සඳහා අනුමත සීමා සහ එම සීමා භාවිතය (රු.මිලියන)**

| අයිතමය | 2014 | | 2015 | |
|---|---|---|---|---|
| | අනුමත සීමා | භාවිතය | අනුමත සීමා | භාවිතය |
| **දළ ණය ගැනීම්** | **1,478,000** | **1,424,506** | **1,780,000** | **1,744,524** |
| දේශීය | 1,146,500 | 1,001,968 | 1,222,000 | 1,188,154 |
| විදේශීය | 331,500 | 422,538 | 558,000 | 556,370 |
| **සමස්ථ මූල්‍යනය** | **1,478,000** | **1,424,506** | **1,780,000** | **1,744,524** |

*මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව*

## 7.2.2 දේශීය මුලාෘනය

### 7.2.2.1 ශුද්ධ දේශීය මුලාෘනය




රූපසටහන 7.2.1 ශුද්ධ දේශීය මූලාෘනයේ උපනතීන්

දේශීය මූලාශ්‍රයන්ගෙන් 2015 වර්ෂයේදී අයවැය හිඟය මූලාෘනයට රුපියල් බිලියන 593 ක ශුද්ධ ණය ගැනීම් සියයට 57 ක වැඩි වීමකි. මෙය අයවැය හිඟයෙන් සියයට 72 කි. 2015 අයවැය හිඟය මූලාෘනයට ශුද්ධ ණය ගැනීම් වලින් රුපියල් බිලියන 608 ක ප්‍රමාණයක් ගණුදෙනු කල හැකි ණය උපකරණ මඟින් වූ අතර රුපියල් බිලියන 15 ක ගණුදෙනු කල නොහැකි ණය ප්‍රමාණයක් ආපසු ගෙවා ඇත. ගණුදෙනු කල හැකි ණය උපකරණ වලින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුතු මඟින් 2014 වර්ෂයේ රුපියල් බිලියන 21 ට සංසන්දනාත්මකව 2015 වර්ෂයේදී ප්‍රමාණය රුපියල් බිලියන 223 කි.

වර්ෂය තුල භාණ්ඩාගාර බිල්පත් වලින් ණය ගැනීම් වල නිකුත්කිරීම් ඉක්මවා ආපසු ගෙවීම් වූ නිසා රුපියල් බිලියන 26.4 ක ශුද්ධ ගලායාමක් පෙන්නුම් කරන ලදි. 2014 වර්ෂයේ රුපියල් බිලියන 26.1 ක ශුද්ධ ලැබීම් සමඟ සැසඳූ විට ශුද්ධ දේශීය මූලාෘනයෙහි සියයට 4.4 කින් අඩු වීමට හේතු විය. 2015 වර්ෂයේදී ගණුදෙනු කල නොහැකි ණය රුපියල් බිලියන 46.5 ක් ආපසු ගෙවන ලද අතර එයින් ප්‍රධාන වශයෙන් රුපියල් බිලියන 31.4 ක ප්‍රමාණයක් රුපියල් ණය වලින් සමන්විත වේ.

**වගුව 7.2.2 රජයේ අයවැය හිඟය ශුද්ධ දේශීය ප්‍රභවයන්ගෙන් මූල්‍යනය 2014 සහ 2015**

| අයිතමය | වටිනාකම (රු.බිලියන) | | මුළු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස (%) | |
|---|---|---|---|---|
| | 2014 | 2015 | 2014 | 2015 |
| **ස්වරූපය අනුව** | **378.7** | **592.7** | **100.0** | **100.0** |
| ණය උපකරණ අනුව | 416.2 | 607.7 | 109.9 | 102.5 |
| භාණ්ඩාගාර බැඳුම්කර * | 369.1 | 442.6 | 97.5 | 74.7 |
| භාණ්ඩාගාර බිල්පත් * | 26.1 | -26.4 | 6.9 | -4.4 |
| රුපියල් ණය | 0.0 | -31.4 | 0.0 | -5.3 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 21.0 | 223.0 | 5.5 | 37.6 |
| උපකරණ නොවන ණය | -37.5 | -15.0 | -9.9 | -2.5 |
| ශ්‍රී ලංකා මහ බැංකු තාවකාලික අත්තිකාරම් | 34.7 | 7.2 | 9.2 | 1.2 |
| වෙනත් | -72.2 | -22.3 | -19.1 | -3.8 |
| **පරිනතිය අනුව** | **378.7** | **592.7** | **100.0** | **100.0** |
| මැදි කාලයේ සිට දිගු කාලය දක්වා | 390.1 | 634.1 | 103.0 | 107.0 |
| භාණ්ඩාගාර බැඳුම්කර * | 369.1 | 442.6 | 97.5 | 74.7 |
| රුපියල් ණය | 0.0 | -31.4 | 0.0 | -5.3 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 21.0 | 223.0 | 5.5 | 37.6 |
| කෙටිකාලීන | -11.4 | -41.4 | -3.0 | -7.0 |
| භාණ්ඩාගාර බිල්පත් * | 26.1 | -26.4 | 6.9 | -4.4 |
| ශ්‍රී ලංකා මහ බැංකු තාවකාලික අත්තිකාරම් | 34.7 | 7.2 | 9.2 | 1.2 |
| වෙනත් | -72.2 | -22.3 | -19.1 | -3.8 |
| **ගනුදෙනු කළ හැකි ස්වභාවය අනුව** | **378.7** | **592.7** | **100.0** | **100.0** |
| ගනුදෙනු කළ හැකි | 416.2 | 639.2 | 109.9 | 107.8 |
| භාණ්ඩාගාර බිල්පත් * | 26.1 | -26.4 | 6.9 | -4.4 |
| භාණ්ඩාගාර බැඳුම්කර * | 369.1 | 442.6 | 97.5 | 74.7 |
| ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර | 21.0 | 223.0 | 5.5 | 37.6 |
| ගනුදෙනු කළ නොහැකි | -37.5 | -46.5 | -9.9 | -7.8 |
| **ආයතන අනුව** | **378.7** | **592.7** | **100.0** | **100.0** |
| බැංකු | 126.9 | 291.8 | 33.5 | 49.2 |
| ශ්‍රී ලංකා මහ බැංකුව | 35.7 | 80.3 | 9.4 | 13.5 |
| වාණිජ බැංකුව | 91.3 | 211.6 | 24.1 | 35.7 |
| බැංකු නොවන අංශය | 251.8 | 300.9 | 66.5 | 50.8 |

*මූලාශ්‍ර :භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව*

**විදේශිකයන් විසින් කරන ලද ආයෝජන හැර*


### 7.2.3 නොපියවූ දේශීය ණය

2015 වර්ෂයේ අවසානයට රජයේ මුළු දේශීය ණය වලින් භාණ්ඩාගාර බැඳුම්කර හා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වල කොටස පිළිවෙලින් සියයට 67 ක් හා සියයට 13 ක් වූ අතර භාණ්ඩාගාර බිල්පත් වල 2014 වර්ෂයේ අවසානයට සියයට 16 කොටස 2015 වර්ෂයේ අවසානයට සියයට 13 ට අඩු විය. ඉතිරිය ශ්‍රී ලංකා මහ බැංකුව තාවකාලික අත්තිකාරම් (සියයට 3) , රුපියල් ණය (සියයට 0.5) හා වෙනත් ණය (සියයට 3) මගින් සමන්විත වේ. 2014 දී රුපියල් ණය වල සියයට 1.3 ක කොටස 2015 දී නිකුත් කිරීම් නොවූ නිසා සියයට 0.5 දක්වා අඩුවීම තුලින් ගණුදෙනු කල හැකි ණය උපකරණ කෙරෙහි ඇති වැඩි නැඹුරුතාවය පෙන්නුම් කෙරේ.

2014 වර්ෂයට සාපේක්ෂව භාණ්ඩාගාර බැඳුම්කර ප්‍රමාණය සියයට 16 කින් වැඩි වීම 2015 දී රුපියල් බිලියන 3,305 ක් වූ අතර භාණ්ඩාගාර බිල්පත් ප්‍රමාණය සියයට 5.3 කින් අඩු වී රුපියල් බිලියන 658 ක් විය. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ප්‍රමාණය සියයට 71 කින් සැලකිය යුතු ලෙස වැඩි වී 2015 වර්ෂය අවසානයේදී රුපියල් බිලියන 668 ක් විය.

#### 7.2.3.1 දේශීය ණය කල්පිරීමේ ව්‍යුහය

වගුව7.2.2 දේශීය ණය පරිනතවීමේ ව්‍යුහය




2015 වර්ෂය අවසාන වන විට රජයේ මුළු දේශීය ණය වලින් මැදි කාලයේ සිට දිගු කාලය තෙක් එනම් වර්ෂයකට වැඩි කාලයක් තුල කල්පිරෙන ණය සියයට 82 කින් සමන්විත වූ අතර කෙටි කාලීන එනම් වර්ෂයකට අඩු කාලයක් තුල කල්පිරෙන ණය සියයට 18 ක් විය.

මැදි කාලයේ සිට දිගු කාලය තෙක් කල්පිරෙන මුළු ණය ප්‍රමාණය තුල රුපියල් බිලියන 3305 ක හෝ සියයට 82 ක භාණ්ඩාගාර බැඳුම්කර ඇතුලත් වූ අතර ඉතිරි සියයට 18 න් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ( සියයට 16.5 ) රුපියල් ණය (සියයට 0.6) සහ වෙනත් (සියයට 1.19) සමන්විත විය.

**7.2.3.2 දේශීය ණය සේවා ගෙවීම්**

2014 වර්ෂයේ රුපියල් බිලියන 777 ක් වූ රජයේ දේශීය ණය සේවා ගෙවීම් වලට සාපේක්ෂව 2015 වර්ෂයේ රුපියල් බිලියන 1,303 ක රජයේ දේශීය ණය සේවා ගෙවීම් වලින් ගෙවීම් සියයට 68 ක වැඩිවීමකි. මුළු ණය සේවා ගෙවීම් වලින් රුපියල් බිලියන 794 ( සියයට 60.9) ක් ණය ආපසු ගෙවීම් වන අතර ඉතිරි රුපියල් බිලියන 510 ( සියයට 39.1) ක ප්‍රමාණය පොළී ගෙවීම් වේ. පෙර වර්ෂයට සාපේක්ෂව 2015 වර්ෂයේදී ණය ආපසු ගෙවීම් හා පොළී ගෙවීම් පිළිවෙලින් රුපියල් බිලියන 344 කින් හා රුපියල් බිලියන 182 කින් වැඩිවී ඇත.

සමස්ථ දේශිය ණය සේවා ගෙවීම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් 2014 වර්ෂයේ පැවති සියයට 7.9 සිට 2015 වර්ෂයේදී සියයට 11.7 දක්වා වැඩි වීමක් පෙන්නුම් කරයි. දේශීය පොළී ගෙවීම් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 3.4 සිට සියයට 4.6 දක්වා ඉහළ ගොස් ඇති අතර දේශිය ණය ආපසු ගෙවීම් පෙර වර්ෂයේ පැවති සියයට 4.6 සිට සියයයට 7.1 දක්වා ඉහළ ගොස් ඇත. සමස්ත ආදායමේ ප්‍රතිශතයක් ලෙස පෙර වර්ෂයේ සියයට 65.1 ක් වූ ණය සේවා ගෙවීම් 2015 වර්ෂයේදී සියයට 89.6 දක්වා ඉහළ ගොස් ඇත.

වගුව 7.2.3 **දේශිය ණය සේවාකරණ ගෙවීම්**
**(රු.මිලියන )**

| වර්ෂය | ණය ආපසු ගෙවීම් | පොළී ගෙවීම් | එකතුව |
|---|---|---|---|
| 2005 | 203,347 | 113,164 | 316,511 |
| 2006 | 247,536 | 133,787 | 381,323 |
| 2007 | 252,165 | 161,370 | 413,535 |
| 2008 | 258,720 | 182,198 | 440,918 |
| 2009 | 401,296 | 273,977 | 675,273 |
| 2010 | 389,672 | 297,127 | 686,799 |
| 2011 | 439,894 | 288,134 | 728,028 |
| 2012 | 415,441 | 317,659 | 733,100 |
| 2013 | 496,042 | 354,706 | 850,748 |
| 2014 | 449,554 | 327,934 | 777,488 |
| 2015 | 793,547 | 509,674 | 1,303,221 |

*මූලාශ්‍ර : භාණ්ඩගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව ,රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව*

## 7.3 විදේශාධාර කළමනාකරණය

ප්‍රතිපූර්ණය කල හැකි විදේශාධාර යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා අග්‍රිම මුදල් නිදහස් කිරීම ව්‍යාපෘතිවල බැංකු ගිණුම්වලට සෘජුවම හෝ එම ව්‍යාපෘති අයත්වන අමාත්‍යාංශ හරහා සිදු කරනු ලැබේ. 2015 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය තුල ප්‍රතිපූර්ණය කල හැකි විදේශාධාර යටතේ රුපියල් මිලියන 1,927 ක මුදලක් නිදහස් කර ඇති අතර රුපියල් මිලියන 970 ක වටිනාකමකින් යුක්ත ද්‍රව්‍ය හා උපකරණ ලැබීම්වලට අමතරව විදේශාධාර මූල්‍ය ප්‍රදාන වශයෙන් රුපියල් මිලියන 5043 ක මුදලක් රජයට ලැබී ඇත.

ණය ප්‍රදායක ආයතන ශ්‍රී ලංකාවට සෘජුව ලබා දෙන අරමුදල් ලබා ගැනීම පහසුවනු පිණිස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අග්‍රිම අරමුදල් ගිණුම් පවත්වාගෙන යනු ලැබේ.2015 වසර තුලදී මෙවැනි ගිණුම් 09 ක් අළුතින් ආරම්භ කිරීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව කටයුතු යොදා ඇති අතර, 2015 වසර අවසාන වන විට වසර තුල ක්‍රියාත්මක වූ එවැනි ගිණුම් සංඛ්‍යාව 105 කි. මෙම ගිණුම්වලට 2015 වසර තුලදී ණය ප්‍රදායක ආයතනවලින් රුපියල් මිලියන 38,148 ක මුදලක් ලැබී ඇත.

## 7.4 රාජ්‍ය ආදායම්

### 7.4.1 ආදායම් රැස්කිරිම

භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ආදායම් ශිර්ෂ 10 ක් සම්බන්ධව ආදායම් ගනන් දීමේ නිලධාරියා ලෙස කටයුතු කරන අතර, එයින් උප ණය මුදල් හි වාරික සහ පොලී ආදායම් රැස් කිරීම වෙනුවෙන් ආදායම් ශිර්ෂ 2ක් වෙන් කර ඇත. ඉතිරි ආදායම් ශිර්ෂ 08 විශේෂයෙන් එක් දෙපාර්තමේන්තුවකට හෝ අමාත්‍යාංශයකට පමණක් වෙන්කල නොහැකි ආදායම් රැස් කිරීම සඳහා ඇති කර ඇත. සමාලෝචනයට භාජනය වන වර්ශය තුලදී රුපියල් බිලියන **162.3** ක් වූ ඇස්තමේන්තුගත රජයේ මුළු බදු නොවන ආදායමෙන් 21.3 % ක් එනම් රුපියල් බිලියන **34.7** ක මුදලක් පහත දක්වා ඇති බදු නොවන ආදායම් ශිර්ෂ 10 යටතේ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුනි.

වගුව 7.4.(අ) : භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ආදායම් එකතු කිරීමේ නිලධාරියා ලෙස කටයුතු කරන බදු සහ බදු නොවන ආදායම් එකතු කිරීම 2014 - 2015(රුපියල් මිලියන)

| ආදායම් විස්තරය | 2014 වර්ෂය | | 2015 වර්ෂය | |
|---|---|---|---|---|
| | ආදායම් ඇස්තමේන්තුව | රැස් කරන ලද ආදායම් | ආදායම් ඇස්තමේන්තුව | රැස් කරන ලද ආදායම |
| **බදු නොවන ආදායම්** | | | | |
| රජයේ ගොඩනැගිලි කුලී | 650.0 | 641.7 | - | - |
| අනෙකුත් කල්බදු කුලි | 3,120.0 | 3,509.9 | 200.0 | 95.0 |
| උපණය සඳහා පොලි | 8,425.0 | 6,757.8 | 3,850.0 | 3,544.8 |
| වෙනත් පොලි ආදායම් | 1,475.0 | 1,220.1 | 1,400.0 | 953.5 |
| දෙපාර්තමේන්තු විකුණුම් | 100.0 | 98.7 | 110.0 | 143.1 |
| විවිධ පරිපාලනාත්මක ගාස්තු | 8,000.0 | 2,851.6 | 5,500.0 | 4,710.4 |
| දඩ හා රාජසන්තක කිරිම් - වෙනත් | 3,000.0 | 2,735.8 | 1,000.0 | 962.0 |
| අනෙකුත් ලැබිම් | 12,000.0 | 4,705.3 | 18,800.0 | 9,342.8 |
| අනෙකුත් වර්ථන පැවරිම් | 2,200.0 | 1,867.9 | 2,000.0 | 1,935.5 |
| ප්‍රාග්ධන වත්කම් විකිණිම | 300.0 | 17,604.3 | 350.0 | 97.9 |
| ණය ආපසු අයකිරිම | 14,750.0 | 14,892.3 | 14,000 | 12,960.8 |

| | | | | |
|---|---|---|---|---|
| **බදු නොවන ආදායම් එකතුව** | **54,020.0** | **56,885.4** | **47,210** | **34,745.8** |
| **බදු ආදායම** | | | | |
| විදුලි සංදේශන බද්ද | 32,000.0 | 31,351.4 | - | - |
| **දෙපාර්තමේන්තුව එකතු කළ මුළු ආදායම** | **86,020.0** | **88,236.8** | - | - |

බදු නොවන ආදායම් ශීර්ෂ 10 හැරුණු කොට භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ආදායම් ගණන්දීමේ නිලධාරී ලෙස කටයුතු කරන විදේශ ප්‍රදාන ආදායම් ශීර්ෂය යටතේ 2015 වර්ෂය තුළදී රුපියල් බිලියන 6 ක මුදලක් එකතු කර ගිණුම් ගත කරන ලදී. මේ අනුව 2015 වර්ෂය තුළදී භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව මගින් ආදායම් ශීර්ෂ 11 ක් යටතේ රුපියල් මිලියන 40.7 ක මුදලක් රැස්කර ගිණුම් ගත කිරීමට කටයුතු කර තිබේ.

රජයේ ආදායම් එකතු කිරීමේ කාර්යක්ෂමතාව වඩාත් වැඩි දියුණු කිරීම සඳහා 2015 වර්ෂය ආරම්භයේදී ගනු ලැබූ පියවරක් ලෙස භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල් ආදායම් ගණන් දීමේ නිලධාරියා ලෙස මෙතෙක් කටයුතු කළ ආදායම් ශීර්ෂ 3 ක් සම්බන්ධයෙන් වඩාත් සමීපව අධීක්ෂණය කළ හැකි දෙපාර්තමේන්තු තෝරා එම ආදායම් ශීර්ෂ සම්බන්ධ ගණන් දීමේ නිලධාරීන් ලෙස එම දෙපාර්තමේන්තු ප්‍රධානීන් පත් කරන ලදී.

### 7.4.2 භාණ්ඩාගාර උප ණය

රටේ සංවර්ධන ක්‍රියාවලිය සඳහා අත්‍යාවශ්‍ය අංගයක් වන යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ යෙදී සිටින රාජ්‍ය ව්‍යවසායන් වෙත විදේශ ණය ප්‍රදානය කරනු ලබන ආයතනයන් වෙතින් ලබා ගන්නා ණය මුදල් රජය වඩාත් පහසු කොන්දේසි යටතේ උප ණය වශයෙන් ප්‍රදානය කරනු ලබයි. මෙසේ උප ණය වශයෙන් ප්‍රදානය කරනු ලබන ණය මුදල් සම්බන්ධ ණය වාරික හා පොලී ආදායම් රැස් කිරීමේ වගකීමද භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති තවත් එක් කාර්යයක් වේ. මේ සම්බන්ධව මාසිකව යාවත්කාලීන කරනු ලබන තොරතුරු පද්ධතියක් දෙපාර්තමේන්තුව මගින් පවත්වා ගෙන යනු ලැබේ.

2015 වර්ෂය තුළ රුපියල් බිලියන 13.57 ක මුදලක් උප ණය ලෙස නිදහස් කර ඇති අතර, රුපියල් බිලියන 12.96 ක මුදලක් ණය වාරික ලෙස ආපසු අයකර ගැනීමට දෙපාර්තමේන්තුවට හැකි විය. මීට අමතරව උප ණය වාරික පොලී ආදායම වශයෙන් රුපියල් බිලියන 3.54 ක මුදලක්ද අයකර ගෙන ඇත.


2015 වර්ෂය අවසාන වන විට උප ණය ශේෂය රුපියල් බිලියන 174.19 ක්වූ අතර රාජ්‍ය ව්‍යාපාර, වාණිජ බැංකු, සංවර්ධන බැංකු, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව ඇතුළු විවිධ රාජ්‍ය ආයතන 56 ක් වෙත මෙම උප ණය මුදල් ලබාදී ඇත. ලෝක බැංකුව (World Bank), ආසියානු සංවර්ධන බැංකුව(ADB), ජපාන අන්තර්ජාතික සහයෝගීතා ඒජන්සිය (JICA) වැනි ජාත්‍යන්තර ණය දෙන ආයතන මෙම උපණය මුදල් ප්‍රදානය සඳහා විවිධ සහන කොන්දේසි මත ණය මුදල් සපයා තිබේ.

### 7.4.3 භාණ්ඩාගාර ඇපකර

රාජ්‍ය ව්‍යවසායන් ප්‍රධාන වශයෙන් සිය කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාගැනීම මෙන්ම වාණිජ කටයුතු වෙනුවෙන් අවශ්‍ය වන අරමුදල් දේශීය හා විදේශීය මූල්‍යායතන වෙතින් සම්පාදනය කර ගැනීමේදී ඒ සඳහා අවශ්‍ය වන භාණ්ඩාගාර ඇපකර, 2003 අංක 3 දරන මූල්‍ය කළමනාකරණ (වගකීම්) සංශෝධන පනතේ විධිවිධානවලට සහ අදාල පරිදි කැබිනට් මණ්ඩලයේ අනුමැතියට යටත්ව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කිරීමට කටයුතු කරනු ලබයි.

2015 වර්ෂය අවසාන වන විට රුපියල් බිලියන 593.01 ක් වටිනා භාණ්ඩාගාර ඇපකර ප්‍රමාණයක් නිකුත් කර තිබුණි. මේ ආකාරයට නිකුත් කර ඇති භාණ්ඩාගාර ඇපකර වලින් 50.11% ක් නිකුත් කර ඇත්තේ විදුලිබල සහ බලශක්ති ක්ෂේත්‍රය වෙත කරනු ලබන ආයෝජනයන් ආවරණය කිරීම සඳහා වේ.

**වගුව 7.4.(ආ) : භාණ්ඩාගාර ඇපකරවල ආංශික සංයුතිය 2015**



## 7.5 භාණ්ඩාගාර කේවල ගිණුම් සහ භාණ්ඩාගාර මූල්‍ය කළමනාකරණ පද්ධතින් වල ක්‍රියාකාරීත්වය

රජයේ දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ සතුව පවතින අරමුදල් වඩාත් ඵලදායිව හා කාර්යක්ෂමව කළමනාකරණය සඳහා නිසි බැංකු පද්ධතියක අවශ්‍යතාවය ප්‍රධාන සාධකයකි. දිවයිනේ බැංකු පද්ධතිය ජාලගතව සම්බන්ධ වීමත් සමග රාජ්‍ය මුදල් කළමනාකරණයේ කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාවය වඩාත් වැඩි දියුණු කල හැකි රාජ්‍ය අරමුදල් කළමනාකරණ ක්‍රියාවලිය තුල වැදගත් වන භාණ්ඩාගාර කේවල ගිණුම් ක්‍රමය 2007 වර්ෂයේ දී භාණ්ඩාගාරය මගින් හඳුන්වා දෙන ලදි.


ඒ අනුව 2015.12.31 දිනට භාණ්ඩාගාර කේවල ගිණුම් ක්‍රමය යටතේ සහ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම් නමින් පවත්වාගෙන යනු ලබන සමස්ථ නිල බැංකු ගිණුම් ප්‍රමාණය 2,391 ක් වූ අතර එය බැංකු අතර බෙදී ගිය ආකාරය පහත වගුවෙන් දැක්වේ.

| | ලංකා බැංකුව | මහජන බැංකුව | ශ්‍රී ලංකා මහ බැංකුව | එකතුව |
|---|---|---|---|---|
| කේවල ගිණුම් පද්ධතිය යටතේ පවතින නිල ගිණුම් | 1,561 | 802 | 0 | 2,363 |
| භා.නි.ලේ. නමින් පවත්වාගෙන යනු ලබන ප්‍රධාන නිල බැංකු ගිණුම් | 1 | 1 | 4 | 6 |
| කේවල ගිණුම් පද්ධතියෙන් පිටත දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නමින් පවත්වාගෙන යනු ලබන රැස්කිරීමේ ගිණුම් | 16 | 6 | 0 | 22 |
| මුළු එකතුව | 1,578 | 809 | 4 | 2,391 |

ඒකාබද්ධ අරමුදල යටතේ ක්‍රියාත්මක වන රජයේ නිල බැංකු ගිණුම් ක්‍රියාත්මක කිරිම භාණ්ඩාගාර කේවල ගිණුම් පද්ධතිය යටතට ගැනීම හේතුවෙන් බැංකු සමඟ කරනු ලබන මූල්‍ය ගණුදෙනු සාපේක්ෂව සහ ආර්ථිකමය වශයෙන් ඵලදායීව සිදු කිරීමටත්, බැංකු අයිරා හා ඒ මත දැරීමට සිදුවන පොලී වියදමද අඩුකර ගැනීමටත් හැකි විය.මෙමගින් දිවයින පුරා විහිදී ගිය නිල බැංකු ගිණුම් වල නිකරුණේ මුදල් රැදීමේ තත්වයන් (Idle cash balances) ඇතිවීම වලකා ගත හැකිවේ.

සාමාන්‍යයෙන් රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල බැංකු ගිණුම්වල පවතිනු ලබන දෛනිකව භාවිතා නොකල බැර ශේෂය 2015 වර්ෂයේ දී රුපියල් බිලියන 21 කට ආසන්න අගයක් ගන්නා ලදී. එම ශේෂය මෙම ගිණුම් පද්ධතිය මගින් භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ගිණුමට තාවකාලිකව බැර කිරීම මගින් අයිරා පොළී වියදම රුපියල් බිලියන 5.32 කින් ඉතිරි කර ගැනීමට හැකි විය. මෙම ගිණුම් පද්ධතිය ක්‍රියාත්මක නොවී නම් මුළු අයිරා පොළිය 32 % කින් ඉහල යාමට ඉඩ තිබුණි. මෙය පහත ප්‍රස්තාරය මගින් පිළිබිඹු වේ.

ප්‍රස්තාරය



භාණ්ඩාගාර මෙහෙයුම් පද්ධතිය මගින් ලබාගත යුතු වන මූල්‍ය කළමනාකරණ තොරතුරු අවශ්‍යතාවන් සපුරාගත හැකි වන පරිදි හා පද්ධතිය පරිශීලනය කරනු ලබන අයට භාවිතය වඩාත් පහසු වන ලෙස භාණ්ඩාගාර මූල්‍ය කළමනාකරණ පද්ධතිය 2008 වර්ෂයේදී හඳුන්වාදෙන ලදී. අභ්‍යන්තර කළමනාකරණ රැස්වීම් වලදී ආයතනයේ පද්ධතීන් වැඩිදියුණු කිරීම පිළිබඳව නිරන්තරව කරනු ලබන සාකච්ඡාවන් හි ප්‍රතිඵලයන් ලෙස අදාල මෙහෙයුම් පද්ධති සම්බන්ධව තාක්ෂනික පසු විපරම් කරනු ලබන සේවා ආයතනයේ නිරන්තර සම්බන්ධතාවයන් ලබා ගනිමින් 2015 වර්ෂයේදී ද අදාල පද්ධතිය තවදුරටත් ආයතන අවශ්‍යතා අනුව යාවත්කාලීන කිරීම සිදුකරන ලදී. මෙම පද්ධතිය තුලින්ම අවශ්‍ය කළමනාකරණ තොරතුරු කාලීනව ලබාගත හැකි වීම දෙපාර්තමේන්තුවේ දෛනික මූල්‍ය කළමනාකරණ තීරණ ගැනීමෙහිලා වඩාත් ඵලදායීව ඉවහල් වේ. මෙමගින් ඒකාබද්ධ අරමුදලට අයත් සියළු ගණුදෙනු, ලැබීම හා ගෙවීම සිදු කල හැකි අතර, දිනය අවසානයේදී මුදල් තත්වය පිළිබඳ සමස්ත ඇගයීමක් සඳහා අවශ්‍ය තොරතුරු සපයනු ලබන බැවින් කළමනාකරණ උපාංගයක් ලෙස මෙම පද්ධතිය මගින් ජනනය කරනු ලැබූ තොරතුරු ඵලදායී තීරණගැනීම සඳහා ඉහළ කළමනාකාරීත්වයට මනා පිටුවහලක් විය.

2015 වර්ෂයේ දී අන්තර් බැංකු ගනුදෙනු හැර රුපියල් බිලියන 4,330.3 ක මුළු ලැබීම් හා රුපියල් බිලියන 4,400.6 ක මුළු ගෙවීම් මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කර ඇත. මෙම සියළුම ලැබීම් හා ගෙවීම් සිදු කරන ලද්දේ මුදල් ලැබීම් වවුචර් 9,444 කින් හා ගෙවීම් වවුචර් 18,252 කිනි. ශ්‍රී ලංකාවේ මූල්‍ය ගනුදෙනු ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව, පහසුව හා ආරක්ෂිත බව තහවුරු කරමින් මෙම සියළුම ගෙවීම් වවුචර් 18,252 ක ප්‍රමාණය 17,933 ක ගනුදෙනු මගින් සිදු කරන ලදී. මෙම ගෙවීම් වවුචර් වලින් 88 % ක් එනම් 16,062 ක ප්‍රමාණයක් සිදු කරන ලද්දේ විද්‍යුත් ගෙවීම් පහසුකම් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව, ලංකා බැංකුව හා මහජන බැංකුව හරහාය. ඊට අමතරව තත්කාලීන දළ පියවුම් ක්‍රමය හරහා අන්තර් බැංකු ගනුදෙනු 319 ක් සිදු කරන ලදී. තව ද මුළු ලැබීම් වවුචර් 9,444 කින් 76.7 % ක් සිදු කරන ලද්දේ චෙක්පත් භාවිතා නොකර විද්‍යුත් මුදල් හුවමාරු කිරීම් මගිනි.

## 7.6 දේපල ණය ඇපකර අරමුදල

2005 වර්ෂයේ අයවැය යෝජනාවක් අනුව සෑම රජයේ සේවකයකුටම වටිනා වත්කමක් ලබා දීම අරමුණු කර ගෙන නිවාසයක් හිමිකර ගැනීම සඳහා බැංකු ක්‍රමය උපයෝගී කර ගෙන නව ණය යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මේ යටතේ ණය ලබා ගත් නිලධාරියකු මියගියේ නම් හෝ පූර්ණ අකර්මන්‍ය තත්වයට පත්වූයේ නම් ණය ශේෂය පියවීම සම්බන්ධව බැංකුව වෙත ඇතිවන අවදානම සමනය කිරීම සඳහා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව භාරයේ ණය ඇපකර අරමුදල පිහිටුවන ලදී.

ඒ අනුව මූලික ආයෝජනය ලෙස රු.මිලියන 916 ක මුදලක් භාණ්ඩාගාර බැඳුම්කරවල ආයෝජනය කර 2005.08.05 දින මෙම අරමුදල ස්ථාපනය කරන ලදී. 2015.12.31 දින වන විට මෙම ආයෝජනය රු.මිලියන 1,134 දක්වා වර්ධනය වී ඇත.

වගුව : දේපල ණය ඇපකර අරමුදලින් ණය ශේෂ පියවීමේ ප්‍රගතිය 2005 - 2015

| වර්ෂය | 2005 - 2013 | 2014 | 2015 | එකතුව |
|---|---|---|---|---|
| මියගිය/පූර්ණ අකර්මන්‍ය වූ/වෛද්‍ය හේතුමත විශ්‍රාම ගැන්වූ නිලධාරි සංඛ්‍යාව | 316 | 46 | 77 | 439 |
| පියවන ලද මුළු මුදල රු. මිලියන | 235.3 | 32.4 | 65.3 | 333.0 |

ඉහත වගුවේ විස්තර අනුව මෙම අරමුදල ආරම්භයේ සිට 2015.12.31 දින දක්වා මියගිය/පූර්ණ අකර්මන්‍යතාවය නිසා සෞඛ්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වූ රාජ්‍ය නිලධාරින් 439 දෙනෙකු වෙනුවෙන් පැවති ණය ශේෂයන් එකවර පියවීම් වශයෙන් රු.මිලියන 333 ක මුදලක් අදාල රාජ්‍ය බැංකු වෙත ගෙවා තිබේ. මෙම අරමුදල කාර්යක්ෂමව කළමණාකරණය කිරීම තුලින් ඉදිරියේ දී රාජ්‍ය සේවකයින්ගේ අභිවෘද්ධිය සඳහා වන තවත් සහනයන් ක්‍රියාත්මක කිරීමට රජයට සහය විය හැකි වෙතැයි දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.